*සැ. යු.* - 2022.11.11 දින පළ වූ අංක 2306 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,307 - 2022 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2022.11.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 246 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 247 |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 දෙසැම්බර් මස 09 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 නොවැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ටී. ජී. එස්. සජීවනී වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999.09.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගා/ 13/ප්‍ර/54529 හා එල්. එල්. නියා/31බී/0773 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පොරවගම පදිංචි මලවි ආරච්චි ගමගේ සිරිනාවතී වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO B15/30 යටතේ 2005.11.02 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.16** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙන්තොට වළල්ලාවිට (දකුණ) /කෝරළේ 31බී නාරංඔිට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාරංඔිට නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත - අංක අ.ග.පි. 590 දරන කට්ටි කැබීමේ පිඹුරේ පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්කර 01, පර්චස් 12ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | එච්. වී. ඇලිස් නෝනාගේ බදු ඉඩම, |
| *නැගෙනහිරට* | : | කේ. කේ. සිරිසෝම සහ එස්. ඩබ්. ප්‍රේමසිරිට අයත් බදු ඉඩම, |
| *දකුණට* | : | එන්. ජී. නන්දසිරිට අයත් බදු ඉඩම, |
| *බස්නාහිරට* | : | ඊ. කේ. සොපිනෝනාට අයත් ඉඩම. |

ටී. ජී. එස්. සජීවනී,
ප්‍රාදේශීය ලේකම්,
නියාගම.

2022 මැයි මස 31 වැනි දින.

11 - 361/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ධම්මික එස්. වීරකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් 05 වැනි දින ප්‍රදානය කර ඇති අංක 2/ගා/16/ප්‍ර 22302 (එල්. එල්. 15185) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පනංගල බටහිර පදිංචි පනංගල විතානගේ වෙලුන් වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO G16/140 අංක යටතේ 1995.12.14 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.16** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිනිදුම් පත්තුවේ පනංගල බටහිර 225ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පනංගල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. (අ.ග.සි. 488 ඉස්කෝලේගොඩ)

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජේ. ආරියදාසගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | පී. වී. වෙලුන්ගේ ඉඩම, |
| *දකුණට* | : | ඉස්කෝලේ ගොඩැල්ල ප්‍රවේනි ඉඩම, |
| *බස්නාහිරට* | : | ඩබ්. ඒ. සෝමදාසගේ ඉඩම. |

ඩී. ධම්මික එස්. වීරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
තවලම.

2022 දෙසැම්බර් මස 21 වැනි දින.

11 - 361/ 2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් තවලම ගමගේ දීපිකා නිලංගි ඩයස් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් 15 වැනි දින ප්‍රදානය කර ඇති අංක 2/ගා/11/ප්‍ර 24114 - L.L. 22431 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පොල්පාගොඩ පදිංචි නානායක්කාර මැටරඹ කෝරලේගේ හින්නි බබුන් වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO D25/ 200 යටතේ 1995.12.14 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.12.16** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්පෙ උතුර පත්තුවේ පොල්පාගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අ. ග. පි. 642 පොල්පාගොඩ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, පර්චස් 16ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : කුරල්ලො කැ හේන

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඩී. ඇම්. කරුණාවතීගේ එල්. එල්. 22339 බලපත්‍ර ඉඩම, |
| *නැගෙනහිරට* | : | ඩී. ඇම්. කුසුමාවතීගේ 49767 බලපත්‍ර ඉඩම, |
| *දකුණට* | : | එම්. කේ. සිරිසේනගේ 55989 බලපත්‍ර ඉඩම, |
| *බස්නාහිරට* | : | ඩී. ඇම්. පියදාසගේ එල්. එල්. 14209 බලපත්‍ර ඉඩම. |

ටී. ජී. ඩී. නිලංගි ඩයස්,
ප්‍රාදේශීය ලේකම්,
යක්කලමුල්ල.

2022 ජනවාරි මස 31 වැනි දින.

11 - 361/ 3

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/69556.
පළාත්/ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/TRI/KUC/110

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉරණයිකේණි 239 ඒ ග්‍රාම නිලධාරී වසමේ ඉරණයිකේණි ගමේ කැඩැස්තර සිතියම් අංක 260222 හි කැබලි අංක 195 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6739 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා පිරමානගේ ඥාණවර්ධන රාජපක්ෂ මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | 114, 194 සහ 181 වැනි බිම් කැබලි, |
| නැගෙනහිරට | : | 194, 181 සහ 118 වැනි බිම් කැබලි, |
| දකුණට | : | 118 සහ 116 වැනි බිම් කැබලි, |
| බටහිරට | : | 116, 113 සහ 114 වැනි බිම් කැබලි. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.07.07 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. එල්. පී. සුභාෂිණී,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, "මිහිකත මැඳුර",
ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 356

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70774.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/L10/LS/TRI/T&G/229.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වෙල්වෙරි කිව් ග්‍රාම නිලධාරී වසමේ වෙල්වෙරි ගමේ අංක 455A/2021 දරන අනුරේඛනයෙහි කැබලි අංක 1 දරන ප්‍රමාණයෙන් අක්කර 35ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා පතිරන්නැහැලාගේ සාන්තා හේමන්තා හෙට්ටිආරච්චි මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

කැබලි අංක 1 හි මායිම්

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | රජයේ ඉඩම, |
| නැගෙනහිරට | : | රජයේ ඉඩම, |
| දකුණට | : | රජයේ ඉඩම, |
| බටහිරට | : | ප්‍රවේශ මාර්ගය සහ පාර. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.10.05 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2022.10.05 දින සිට අවුරුදු 05ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. එල්. පී. සුභාෂිණි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 357

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/55313.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ප. ඉ. කො/06/ගම්/දිවු/09.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 49, නැ/උල්ලලපොල ග්‍රාම නිලධාරි වසමේ උල්ලලපොල ගමේ කැ.සි.510011 කලාප අංක 8 පිඹුරේ කැබලි අංක 171 න් දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 14.5ක ඉඩම සමිති කටයුතු සඳහා සී/ස කොටදෙණියාව විවිධ සේවා සමුපකාර සමිතිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 8:1 සහ 172, |
| නැගෙනහිරට | : | කැබලි අංක 172, |
| දකුණට | : | කැබලි අංක 172, |
| බටහිරට | : | කැබලි අංක 8:21 සහ 8:1. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.09.21 දින සිට ඉදිරියට)

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

*(ඇ)* මෙම ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2020.09.21 දින සිට වසර පහක් ගත වන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 නොවැම්බර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර", අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 358

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/60743.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ප. ඉ. කො./06/ගම්/දිවු/08.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 79, වල්පිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රජයේ ගොවිපල - වල්පිට ගමේ ක. සි. 510004 පිඹුරේ කැබලි අංක 1.54 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.032 ක් ඉඩම වාණිජ කටයුතු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 1:55, |
| නැගෙනහිරට | : | කැබලි අංක 1:55, |
| දකුණට | : | කැබලි අංක 1:55, |
| බටහිරට | : | කැබලි අංක 1:55. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2020.06.03 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.06.03 දින සිට අවුරුදු 05ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 නොවැම්බර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර", අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 359

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70522.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/L10/LS/TRI/T&G/230.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විල්ගම 243 ඊ ග්‍රාම නිලධාරී වසමේ විල්ගම ගමේ අංක 395/ 2021 දරන අනුරේඛනයෙහි කැබලි අංක 1 දරන ප්‍රමාණයෙන් අක්කර 30ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු

සඳහා ඇග්රෝලී පුද්ගලික සමාගම නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

කැබලි අංක 1 හි මායිම් :

උතුරට : රජයේ ඉඩම,
නැගෙනහිරට : පාර (RDA),
දකුණට : පාර (RDA) සහ රජයේ ඉඩම,
බටහිරට : රජයේ ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.10.05 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2022.10.05 දින සිට අවුරුදු 05ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. එල්. පී. සුභාෂිණී,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, "මිහිකත මැදුර", අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 360

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**වීරවිල නව නගර, සද්ධාතිස්සපුර නව නගර සහ ජයගම ග්‍රාම නිලධාරි වසම්වල ඉඩම් කැබලි ටෙන්ඩර් මගින් බදු අයිතිය බැහැර කිරීම**

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වීරවිල හා සද්ධාතිස්සපුර නවනගර ග්‍රාම නිලධාරි වසම්වල පිහිටා ඇති පර්චස් 40 බැගින් වූ මැන සැලසුම් කරන ලද නේවාසික බිම් කොටස් 25ක් සහ කර්මාන්ත (වාණිජ ඉඩම්) බිම් කොටස් 50ක් සහ ජයගම ග්‍රාම නිලධාරි වසමේ පර්චස් 05 බැගින් මැන සැලසුම් කර ඇති කඩ බිම් (වාණිජ ඉඩම්) 05ක් රජයේ ඉඩම් ආඥාපනත යටතේ දකුණු පළාතේ පදිංචි අයවලුන් වෙත ටෙන්ඩර් මගින් බදු අයිතිය බැහැර කිරීමට කටයුතු කරනු ලබන බව මින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳ සියලු විස්තර සහ ටෙන්ඩර් ලියවිලි දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයට පැමිණ ලබාගත හැකි අතර, ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම **2022.11.18** දින සිට **2022.12.09** දින දක්වා දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දී සිදු කෙරේ. ටෙන්ඩර් භාරගැනීමේ කාලය **2022.12.09 දින පෙරවරු 10.00** ට අවසන් වේ. ටෙන්ඩර් විවෘත කිරීම එදිනම **පෙරවරු 11.00** ට දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දී සිදු කෙරේ.

කේ. ඩී. බන්දුල ජයසිංහ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**වීරවිල නව නගර, සද්ධාතිස්සපුර නව නගර සහ ජයගම ග්‍රාම නිලධාරි වසම්වල ඉඩම් කැබලි ටෙන්ඩර් මගින් බදු අයිතිය බැහැර කිරීම**

දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් විසින් (මෙහි මින් මතු දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වශයෙන් හඳුන්වනු ලබන අතර එම පාඨයට මෙම ටෙන්ඩරයේ කාර්ය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් විධිමත් පරිදි බලය පවරන ලද ඕනෑම නිලධාරියෙක් ඇතුළත් වන්නේ ය.) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරවිල හා සද්ධාතිස්සපුර නවනගර ග්‍රාම නිලධාරි වසම්වල පිහිටා ඇති පර්චස් 40 බැගින් වූ මැන සැලසුම් කරන ලද නේවාසික බිම් කොටස් 25ක් ද, කර්මාන්ත (වාණිජ ඉඩම්) බිම් කොටස් 50 ක් ද, ජයගම ග්‍රාම නිලධාරි වසමේ පර්චස් 05 බැගින් මැන සැලසුම්කර ඇති කඩ බිම් (වාණිජ ඉඩම්) 05 ක් ද රජයේ ඉඩම් ආඥාපනත යටතේ ටෙන්ඩර් මගින් දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන් හට බදු අයිතිය බැහැර කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

නේවාසික ඉඩම් අයදුම්පත්‍ර සඳහා රුපියල් 1,000.00ක මුදලක් ද, වාණිජ ඉඩම් අයදුම්පත්‍ර සඳහා රුපියල් 3,000.00ක මුදලක් ද ගෙවා අදාළ ටෙන්ඩර් අයදුම්පත් දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් සතියේ වැඩ කරන දිනයන් හි දී **පෙරවරු 8.30 සිට පස්වරු 4.00** දක්වා කාලය තුළ ලබාගත හැක. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත් "ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, දෙබරවැව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් භාර දිය හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය හා ඒ සමග ඉදිරිපත් කළ යුතු ලියකියවිලි ලියුම් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **නේවාසික ඉඩම් සඳහා නේවාසික වශයෙන් ද, වාණිජ ඉඩම් සඳහා වාණිජ වශයෙන් ද සටහන් කළ යුතු වේ. ටෙන්ඩර් භාරගැනීමේ කාලය 2022.11.18 දිනෙන් ආරම්භ වී 2022.12.09 දින පෙරවරු 10.00ට** අවසන් වේ. නියමිත වේලාවෙන් පසු ලැබෙන ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර සැලකිල්ලට ගනු නොලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම **2022.12.09 දින පෙ.ව. 11.00** ට දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දී සිදු කෙරේ.

**01. ටෙන්ඩර් කොන්දේසි**

1.1 ඉල්ලුම්කරුවන් වාණිජ ඉඩම් කොටසක් සඳහා රුපියල් 5,000.00ක සහ නේවාසික ඉඩම් සඳහා රු. 3,000.00ක ආපසු නොගෙවන තැන්පතුවක් දෙබරවැව ඉඩම් කොමසාරිස් වෙත ගෙවීම් කර එම කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

1.2 මෙම ඉඩම් ඉල්ලුම් කළ හැක්කේ දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ට පමණි.

1.3 ආරම්භක ලංසුව වන්නේ ඉඩමේ තක්සේරුව මත නියම කරන වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

1.4 ටෙන්ඩරයෙන් තෝරාගනු ලබන ලංසුකරුවෙකුගේ නිර්ව්‍යාජ භාවයත්, බද්දෙ හි කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති හැකියාවත් ගැන ඉඩම් කොමසාරිස් ජනරාල් සෑහීමට පත් විය යුතු ය. තමා එසේ සෑහීමට පත් නොවුණහොත් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ටෙන්ඩරය ඉදිරියට කරගෙන යෑමේ බලය ඉඩම් කොමසාරිස් ජනරාල් සතු වන්නේ ය.

1.5 සෑම ඉල්ලුම්කරුවෙකුටම පැමිණ ඉහත කී වේලාවට ඉහත කී ස්ථානයේ ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට පෙනී සිටිය හැකි ය. තමාට පැමිණිය නොහැකි නම් විධිමත් ලෙස බලය පැවරූ ලිපියක් සමග නියෝජිතයකු එවිය හැකි ය. ටෙන්ඩර් විවෘත කිරීමට පෙර පරීක්ෂා කරනු ලබන පිණිස එම නියෝජිතයා විසින් විධිමත්බලය පැවරුම් ලිපිය ඉදිරිපත් කළ යුතු ය.

1.6 තෝරාගනු ලැබූ සෑම ලංසුකරුවෙකු විසින් ම තම ඉල්ලීම පිළිගනු ලැබූ වහාම ටෙන්ඩරයේ දී තීරණය කරන ලද මුදල හා පළමු අවුරුද්දේ බදු මුදල දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්ට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතු ය. තෝරාගනු ලැබූ කෙනෙකු වැඩ කරන දින තුනක් ඇතුළත ඉහත පරිදි කටයුතු කිරීමට අසමත් වුවහොත් ඔහුගේ තෝරා ගැනීම අවලංගු කර, ඔහු විසින් ගෙවා ඇති ඕනෑම මුදලක් රාජසන්තක කිරීමේ බලය ඉඩම් කොමසාරිස් ජනරාල් සතු වේ.

1.7 එලෙස අවලංගු කරන ලද ටෙන්ඩරයක් වෙනුවට, එකී ඉඩමට ටෙන්ඩර් පත් යොමුකර ඇති අයගෙන් ප්‍රමුඛතා පිළිවෙල අනුව ඊළඟට ඇති අයදුම්පත්‍ර පිළිබඳ සලකා බැලීමට කටයුතු කරනු ලැබේ. තව ද, එසේ සලකා බලනු ලබන්නේ ප්‍රමුඛතා පිළිවෙල අනුව වැඩිම දෙවැනි ලංසුව ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරුවන් දක්වා පමණි.

1.8 යම් හෙයකින් ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීමේ දී එකම ලංසුව ඉදිරිපත් කර ඇති තරඟකරුවන් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් සිටීනම්, කුසපත් ඇදීමෙන් සුදුසු ටෙන්ඩර්කරු තෝරාගනු ලැබේ.

**02. පොදු කොන්දේසි :**

සෑම බදුකරයක ම වෙනත් කොන්දේසි අතර පහත සඳහන් කොන්දේසි ඇතුළත් වනු ඇත.

2.1 බද්ද අවුරුදු තිහක (30)ක කාල සීමාවක් සඳහා වන්නේ ය.

2.2 ඉඩම හා එහි ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් ගෙවිය යුතු වන කවර හෝ වරිපනම් අයබදු වෙනත් තක්සේරු හා වියදම් සියල්ලක්ම බදුකරු විසින් ගෙවිය යුතු ය.

2.3 බදුකරු විසින් මෙම බද්ද ඇරඹුණු දින සිට නේවාසික ඉඩම් සඳහා අවුරුද්දක් ද, වාණිජ ඉඩම් සඳහා අවුරුදු තුනක් ද ඇතුළත අදාළ පළාත් පාලන ආයතනය මගින් අනුමත කරන ලද සැලැස්මක් අනුව දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් සෑහීමකට පත් වන පරිදි සංවර්ධන කටයුතු ආරම්භ කළ යුතු ය.

2.4 ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස බදුකරු විසින් එම ඉඩමේ ඇති ගොඩනැගිලි කිසිවකට අලුතෙන් එකතු කිරීම හෝ වැඩි දියුණු කිරීම හෝ අලුතෙන් කිසිවක් නොකළ යුතු ය.

2.5 ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය කල්තියා ලියවිල්ලකින් ලබාගෙන මිස බදුකරු විසින් මෙම බද්ද විෂයෙ හි තමාට ඇති අයිතිය පැවරීම, අතුරු බදුදීම, බදු දීම, උකස් කිරීම, තෑගි දීම *නැතහොත්* අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ගනුදෙනු නොකළ යුතු ය.

එසේ අනුමැතිය ලබා නොගෙන කර ඇති කවර බැහැර කිරීමක් වුවද ශුන්‍ය හා බලරහිත වන්නේය.

2.6 බදුකරු විසින් එම ඉඩමේ ඇති සියලුම ගොඩනැගිලි දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් සෑහීමට පත් වන පරිද්දෙන් මනා පිළිවෙලට තබා ගනිමින් අවශ්‍ය අලුත්වැඩියා ද මැනවින් කළ යුතු ය.

2.7 බදුකරු විසින් දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් සෑහීමකට පත් වන පරිද්දෙන් ඉඩම වටා ප්‍රමාණවත් වැටක් හෝ තාප්ප ඉදි කොට තබාගත යුතු ය.

2.8 ටෙන්ඩරයෙන් තෝරාගෙන සන්තකය භාර ගත් පසු දීර්ඝකාලීන බදුකරයන් ලබා ගැනීමට සුදුසුකම් ලබන අතර, දීර්ඝ කාලීන බදුකරය නිකුත් කරන තෙක් කාලය තුළ යම් හෙයකින් ටෙන්ඩර් කොන්දේසි කඩ කිරීමක් හෝ බදු ගෙවීම් පැහැර හැරීමක් හෝ සිදුකළ අවස්ථාවක දී ඉඩම් සංවර්ධන ආඥාපනතේ 106 වගන්තිය යටතේ කටයුතු කරනු ලැබේ.

2.9 බදු ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමක් මත බදු ගිවිසුම අවලංගු කළහොත් ඉඩමේ ඉදිකරන ලද ගොඩනැගිලි කිසිවක් සඳහා හෝ වෙනත් කිසියම් හේතුවක් මුල් කර ගෙන බදුකරුට රජයෙන් කිසිම වන්දියක් ලැබීමට හිමිකමක් නොමැත.

2.10 ඉහත කොන්දේසි එකක් හෝ කිහිපයක් කඩකර ඇති කල්හි විධිමත් පරීක්ෂණයක් පවත්වා ටෙන්ඩර් මගින් බැහැර කළ ඉඩමක් අවලංගු කිරීමේ බලය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, එසේ අවලංගු කරනු ලැබුවහොත් ටෙන්ඩර්කරු විසින් අදාළ ඉඩමේ නිරවුල් භුක්තිය ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පවරන ලද ඕනෑම අයෙකු ට හෝ නිලධාරියෙකු ට ආපසු භාර දිය යුතු ය.

**03. නේවාසික ඉඩම් සඳහා කොන්දේසි :**

3.1 නේවාසික ඉඩම් බැහැර කරනු ලබන්නේ එක් පවුල් ඒකකයකට එක් ඉඩම් කට්ටියක් පමණි. එසේ නීත්‍යානුකූල නොවන ලෙස ඉඩම් කට්ටියක් ඉල්ලීම් කර ඇත්නම් එම ටෙන්ඩර් අයදුම්පත්‍රය අවලංගු වේ. එක් එක් නේවාසික බිම් කට්ටියක් සඳහා වාර්ෂික බදු කුළිය වන්නේ ඒ ඒ ඉඩම් කට්ටිය සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

3.2 බදුකරු විසින් වාර්ෂික බදු මුදල් නියමිත ආකාරයට දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතු ය. එසේ නියමිත දිනට බදු නොගෙවන බදුකරුගෙන් 10%ක දඩ මුදලක් බදු මුදල සමග අය කර ගනු ලැබේ.

3.3 බදුකරු විසින් නේවාසික ඉඩම් පදිංචිය සඳහා පමණක් පාවිච්චි කළ යුතු අතර, වෙනත් කිසිදු නීත්‍යානුකූල නොවන කටයුත්තකට යොදා නොගත යුතු ය. තව ද ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය කලින් ලබාගෙන මිස අන් කිසිදු කාර්යයක් සඳහා එම ඉඩම පාවිච්චි නොකළ යුතු ය. එලෙස නීත්‍යානුකූල නොවන කටයුත්තකට යොදාගෙන ඇති බව තහවුරු වුවහොත් නැවත ඉඩම රජයට පවරාගනු ලැබේ.

**04. වාණිජ ඉඩම් සඳහා කොන්දේසි :**

4.1 එක් එක් වාණිජ බිම් කට්ටියක් සඳහා වාර්ෂික බදු කුළිය වන්නේ ඒ ඒ ඉඩම් කට්ටිය සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධන වන අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක අගයක් එකතු කර ගණනය කරනු ලැබේ. බදුකරු විසින් වාර්ෂික බදු මුදල් නියමිත ආකාරයට දෙබරවැව අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතු ය. එසේ නියමිත දිනට බදු නොගෙවන බදුකරුගෙන් 10%ක දඩ මුදලක් බදු මුදල සමග අය කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය I
(වීරවිල නවනගරය ග්‍රාම නිලධාරි වසමේ නේවාසික ඉඩම්)

| අනු අංකය | පිඹුර | කැබලි අංකය | ප්‍රමාණය (හෙක්.) | අවම ලංසුව (රු.) | වාර්ෂික බදු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1 | ක.සි. 830008 | 797 | 0.103 | 75,720 | 25,240 |
| 2 | ක.සි. 830008 | 222 | 0.1 | 73,560 | 24,520 |
| 3 | ක.සි. 830008 | 220 | 0.103 | 75,720 | 25,240 |
| 4 | ක.සි. 830008 | 219 | 0.104 | 76,440 | 25,480 |
| 5 | ක.සි. 830008 | 218 | 0.102 | 75,000 | 25,000 |
| 6 | ක.සි. 830008 | 248 | 0.109 | 80,160 | 26,720 |
| 7 | ක.සි. 830008 | 246 | 0.109 | 80,160 | 26,720 |
| 8 | ක.සි. 830008 | 262 | 0.106 | 77,880 | 25,960 |
| 9 | ක.සි. 830008 | 261 | 0.104 | 76,440 | 25,480 |
| 10 | ක.සි. 830008 | 285 | 0.108 | 79,440 | 26,480 |
| 11 | ක.සි. 830008 | 259 | 0.107 | 78,600 | 26,200 |
| 12 | ක.සි. 830008 | 202 | 0.106 | 77,880 | 25,960 |
| 13 | ක.සි. 830008 | 203 | 0.106 | 77,880 | 25,960 |
| 14 | ක.සි. 830008 | 213 | 0.106 | 75,720 | 25,240 |
| 15 | ක.සි. 830008 | 206 | 0.109 | 80,160 | 26,720 |
| 16 | ක.සි. 830008 | 214 | 0.104 | 76,440 | 25,480 |
| 17 | ක.සි. 830008 | 336 | 0.099 | 72,840 | 24,280 |
| 18 | ක.සි. 830008 | 379 | 0.099 | 72,840 | 24,280 |
| 19 | ක.සි. 830008 | 390 | 0.099 | 72,840 | 24,280 |
| 20 | ක.සි. 830008 | 397 | 0.13 | 75,720 | 25,240 |
| 21 | ක.සි. 830008 | 623 | 0.098 | 72,000 | 24,000 |
| 22 | ක.සි. 830008 | 638 | 0.104 | 76,440 | 25,480 |
| 23 | ක.සි. 830008 | 59 | 0.096 | 84,240 | 28,080 |
| 24 | ක.සි. 830008 | 64 | 0.106 | 93,000 | 31,000 |
| 25 | ක.සි. 830008 | 66 | 0.107 | 93,840 | 31,280 |

උපලේඛනය II
(වීරවිල නවනගරය ග්‍රාම නිලධාරි වසමේ කර්මාන්ත ඉඩම්)

| අනු අංකය | පිඹුර | කැබලි අංකය | ප්‍රමාණය (හෙක්.) | අවම ලංසුව (රු.) | වාර්ෂික බදු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1 | ක.සි. 830008 | 231 | 0.113 | 82,800 | 27,600 |
| 2 | ක.සි. 830008 | 232 | 0.108 | 79,440 | 26,480 |
| 3 | ක.සි. 830008 | 234 | 0.108 | 79,440 | 26,480 |
| 4 | ක.සි. 830008 | 235 | 0.112 | 82,320 | 27,440 |
| 5 | ක.සි. 830008 | 236 | 0.11 | 80,880 | 26,960 |

| අනු අංකය | පිඹුර | කැබලි අංකය | ප්‍රමාණය (හෙක්.) | අවම ලංසුව (රු.) | වාර්ෂික බදු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 6 | ක.සි. 830008 | 237 | 0.113 | 83,040 | 27,680 |
| 7 | ක.සි. 830008 | 238 | 0.113 | 83,040 | 27,680 |
| 8 | ක.සි. 830008 | 269 | 0.113 | 83,040 | 27,680 |
| 9 | ක.සි. 830008 | 271 | 0.111 | 81,600 | 27,200 |
| 10 | ක.සි. 830008 | 273 | 0.11 | 80,880 | 26,960 |
| 11 | ක.සි. 830008 | 274 | 0.111 | 81,600 | 27,200 |
| 12 | ක.සි. 830008 | 275 | 0.108 | 79,440 | 26,480 |
| 13 | ක.සි. 830008 | 276 | 0.108 | 79,440 | 26,480 |
| 14 | ක.සි. 830008 | 277 | 0.11 | 80,880 | 26,960 |
| 15 | ක.සි. 830008 | 278 | 0.11 | 80,880 | 26,960 |
| 16 | ක.සි. 830008 | 279 | 0.108 | 79,440 | 26,480 |
| 17 | ක.සි. 830008 | 302 | 0.108 | 79,440 | 26,480 |
| 18 | ක.සි. 830008 | 303 | 0.109 | 80,160 | 26,720 |
| 19 | ක.සි. 830008 | 304 | 0.109 | 80,160 | 26,720 |
| 20 | ක.සි. 830008 | 305 | 0.109 | 80,160 | 26,720 |
| 21 | ක.සි. 830008 | 306 | 0.103 | 75,720 | 25,240 |
| 22 | ක.සි. 830008 | 307 | 0.106 | 77,880 | 25,960 |
| 23 | ක.සි. 830008 | 308 | 0.107 | 78,720 | 26,240 |
| 24 | ක.සි. 830008 | 356 | 0.103 | 75,720 | 25,240 |
| 25 | ක.සි. 830008 | 357 | 0.101 | 74,280 | 24,760 |
| 26 | ක.සි. 830008 | 267 | 0.109 | 80,160 | 26,720 |
| 27 | ක.සි. 830008 | 358 | 0.103 | 75,720 | 25,240 |
| 28 | ක.සි. 830008 | 359 | 0.101 | 74,280 | 24,760 |
| 29 | ක.සි. 830008 | 360 | 0.104 | 76,440 | 25,480 |
| 30 | ක.සි. 830008 | 361 | 0.1 | 73,560 | 24,520 |
| 31 | ක.සි. 830008 | 362 | 0.101 | 74,280 | 24,760 |
| 32 | ක.සි. 830008 | 363 | 0.099 | 72,840 | 24,280 |

**උපලේඛනය III**
**(සද්ධාතිස්සපුර නවනගර ග්‍රාම නිලධාරි වසමේ කර්මාන්ත ඉඩම්)**

| අනු අංකය | පිඹුර | කැබලි අංකය | ප්‍රමාණය (හෙක්.) | අවම ලංසුව (රු.) | වාර්ෂික බදු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1 | අ.භූ.පි. 02 | 5733 | 0.101 | 26,340 | 4,390 |
| 2 | අ.භූ.පි. 02 | 5734 | 0.101 | 26,340 | 4,390 |
| 3 | අ.භූ.පි. 02 | 5737 | 0.1 | 26,100 | 4,350 |
| 4 | අ.භූ.පි. 02 | 5738 | 0.1 | 26,100 | 4,350 |
| 5 | අභූ.පි. 02 | 5739 | 0.101 | 28,740 | 4,790 |
| 6 | අ.භූ.පි. 02 | 5740 | 0.101 | 28,740 | 4,790 |

| අනු අංකය | පිඹුර | කැබලි අංකය | ප්‍රමාණය (හෙක්.) | අවම ලංසුව (රු.) | වාර්ෂික බදු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 7 | අ.හූ.පි. 02 | 5741 | 0.101 | 26,340 | 4,390 |
| 8 | අ.හූ.පි. 02 | 5744 | 0.102 | 29,040 | 4,840 |
| 9 | අ.හූ.පි. 02 | 5747 | 0.101 | 29,040 | 4,840 |
| 10 | අ.හූ.පි. 02 | 5742 | 0.102 | 28,740 | 4,790 |
| 11 | අ.හූ.පි. 02 | 5722 | 0.101 | 31,140 | 5,190 |
| 12 | අ.හූ.පි. 02 | 5723 | 0.101 | 31,140 | 5,190 |
| 13 | අ.හූ.පි. 02 | 5724 | 0.101 | 31,140 | 5,190 |
| 14 | අ.හූ.පි. 02 | 5726 | 0.101 | 31,140 | 5,190 |
| 15 | අ.හූ.පි. 02 | 5728 | 0.101 | 31,140 | 5,190 |
| 16 | අ.හූ.පි. 02 | 5729 | 0.101 | 28,740 | 4,790 |
| 17 | අ.හූ.පි. 02 | 5730 | 0.101 | 26,340 | 4,390 |
| 18 | අ.හූ.පි. 02 | 5732 | 0.101 | 28,740 | 4,790 |

**උපලේඛනය IV**
**(ජයගම ග්‍රාම නිලධාරි වසමේ ඉඩම්)**

| අනු අංකය | පිඹුර | කැබලි අංකය | ප්‍රමාණය (හෙක්.) | අවම ලංසුව (රු.) | වාර්ෂික බදු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1 | අ.හූ.පි. 02 | 6176 | 5.1376 | 15,360 | 2,560 |
| 2 | අ.හූ.පි. 02 | 6175 | 5.1376 | 15,360 | 2,560 |
| 3 | අ.හූ.පි. 02 | 6174 | 5.1376 | 15,360 | 2,560 |
| 4 | අ.හූ.පි. 02 | 6173 | 5.1376 | 15,360 | 2,560 |
| 5 | අ.හූ.පි. 02 | 6172 | 5.1376 | 15,360 | 2,560 |

11-413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.